# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2021.08.16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 ජූලි

### 2021 ජූලි මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.4කින් තවදුරටත් ඉහළ යමින් 2021 ජූලි මාසයේදී 57.8ක අගයක් වාර්තා කරන ලදී.** නව ඇණවුම්, නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් උප දර්ශක වල දක්නට ලැබුණු ඉහළ යෑම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

විශේෂයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සහ ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයන්හි නව ඇණවුම්, නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් වල දක්නට ලැබුණු සැලකිය යුතු ඉහළ යාම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සැළකිය යුතු වර්ධනයට හේතු විය. විශේෂයෙන් යුරෝපා රටවල ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථාවත් වීමත් සමඟ අපනයන ඇණවුම් ඉහළ ගිය බවත්, COVID-19 එන්නත්කරණ වැඩසටහනේ සාර්ථකත්වය සැලකිල්ලට ගෙන සහ ඉල්ලුම ඉහළ යනු ඇතැයි අපේක්ෂාවෙන් නව බඳවා ගැනීම් ආරම්භකල බවත්, එම නිෂ්පාදන අංශවල සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **50.4** | **57.8** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 52.1 | 61.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 43.2 | 54.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.8 | 52.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 45.3 | 51.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 68.9 | 69.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදනයේ සිදුවූ වර්ධනයන් සමඟම, තොග මිලදී ගැනුම් උප දර්ශකය ඉහළ ගිය අතර ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය 2021 ජූලි මාසයේදී තවදුරටත් වර්ධනය විය. ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාදවීම මෙන්ම විදේශ ගෙවීම් පියවීම් ප්‍රමාද වීම, අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ සැපයුම් දාමයට අහිතකර ලෙස බලපාන බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලද අතර එය ඔවුන්ගේ නිෂ්පාදන සැලසුම් ක්‍රියාවලියට බාධා ඇති කර තිබේ.


නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි, COVID-19 වෛරසයේ සීඝ්‍ර ව්‍යාප්තිය සමඟ ඇතිවූ අවිනිශ්චිතතාවය රටේ නිෂ්පාදන කර්මාන්ත කටයුතුවලට බාධාවක් විය හැකිය. ඒ අනුව, පෙර මාසයට සාපේක්ෂව ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස පහළ ගියද, තව දුරටත් එය කඩයිම් මට්ටමෙන් ඉහළ අගයක් වාර්තා කරන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.8**

**2021 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.4ක ඉහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1 කින් පහළ යමින් 2021 ජූලි මාසයේදී 55.4ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 ජූලි මාසයේදී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පෙර මාසයට සාපේක්ෂව එක්සත් ජනපදය සහ ඉන්දියාවෙහි වැඩි වේගයකින් ඉහළ ගිය අතර යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ චීනයෙහි එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී. මේ අතර, රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය තව දුරටත් පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 අගෝස්තු 15 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා ක්‍රියාකාරකම්වල තවදුරටත් වර්ධනය වීමක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 ජූලි මාසයේ දී 55.7ක දර්ශක අගයක් දක්වා ඉහළ ගියේය.** මෙම ඉහළ යෑම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, නිමකිරීමට නියමිත කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදුවූ ඉහළ යෑම් හේතු විය.

මූල්‍ය සේවා, රක්ෂණ, ප්‍රවාහන, විදුලි සංදේශ සහ දේපළ වෙළඳාම යන උපඅංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, නව ව්‍යාපාර උප දර්ශකය 2021 ජුනි මාසය හා සසඳන විට 2021 ජූලි මාසයේ දී ඉහළ යන ලදී.

සංචරණ සීමා ලිහිල් කිරීමට සමාගමීව බොහෝ උප අංශ වල ව්‍යාපාර ක්‍රියාකාරකම් ජූලි මාසයේ දී ඉහළ ගියේය. ඒ අනුව, මූල්‍ය සේවා උප අංශය ජූලි මස තුළ විශාල වර්ධනයක් වාර්තා කළේය. මගී ප්‍රවාහනයේ සහ භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවල දක්නට ලැබුණු වර්ධනයන් හේතුවෙන් ප්‍රවාහන උප අංශය ද සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. තවද, මහජන සෞඛ්‍ය කටයුතු, රක්ෂණ සහ විදුලි සංදේශ යන උප අංශ ද මාසය තුළ වැඩිදියුණු විය. මේ අතර, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමෙන් සහ ආර්ථික කටයුතු ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීමෙන් පසු ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශ ද ධනාත්මක වර්ධනයන් වාර්තා කරන ලදී.

ජූලි මාසය තුළ සිදු කරන ලද නව බඳවා ගැනීම් සංඛ්‍යාව ඉක්මවා විශ්‍රාම යෑම් හා සේවයෙන් ඉවත්වීම් සංඛ්‍යාව ඉහළ යෑම හේතුවෙන් සේවා නියුක්තිය අඩු වේගයකින් අඛණ්ඩව පහළ ගියේය.


නිමකිරීමට නියමිත කාර්යයන් ජූලි මාසයේ දී අඩු වේගයකින් නමුදු ඉහළ යන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**55.7**

**2021 ජුනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.4ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජුනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.3** | **55.7** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 49.0 | 58.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 49.0 | 63.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.1 | 49.0 | - | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 54.2 | 53.2 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 58.3 | 54.5 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් වීමත් සමඟ ජූලි මාසයේ දී ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් අඛණ්ඩව ඉහළ ගියේය. කෙසේ වෙතත්, COVID-19 තෙවන රැල්ල වේගයෙන් ව්‍යාප්ත වීම, ආනයන සීමා කිරීම්, ණයවර ලිපි විවෘත කිරීමේ දී ඇති ප්‍රමාදයන් සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම හේතු කොටගෙන ඇතැම් ප්‍රතිචාර දක්වන්නන්ගේ අපේක්ෂාවන් තරමක් අයහපත් විය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරන නමුත්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 ජුනි මාසයේ පැවති 57.5 සිට 2021 ජූලි මාසයේ දී 56.3 දක්වා පහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 ජූලි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ඉන්දියාව සහ ජපානය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 අගෝස්තු 13 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.